# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක:11/2013**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2013, ඔක්තෝබර් මස 06 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>විශ්වවිද්‍යාල ක්ෂෙත්‍රයේ විධායක/ අධ්‍යයන සහායක/ සෞඛ්‍ය මධ්‍යස්ථාන වල වෛද්‍ය හෝ දන්ත වෛද්‍ය තනතුරු දරන නිලධාරීන්ට පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම් ලබාගැනීම සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති පහත දැක්වෙන චක්‍රලේඛ උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

1990.05.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 440 හි 3(iii) ඡේදය
1994.03.21 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 601
2002.11.08 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 809
2010.09.27 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 931
2010.10.25 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 936

පරිපාලන හා අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණි වලට අයත් නිලධාරීන්ගේ වෘත්තීය මට්ටම නගා සිටුවීමේ අවශ්‍යතාව පිළිබඳ සලකා බැලූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එහි 872 වැනි රැස්වීමේදී පහත දැක්වෙන නිලධාරි කාණ්ඩ සඳහා (චක්‍රලේඛ අංක 905 හිදී කාණ්ඩගත කර ඇති ආකාරයට) තම රාජකාරී කටයුතු වලට සෘජුවම අදාල වන පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම පිණිස ඔවුන්ගේ සේවා කාලය තුල එක් වරක් පමණක් අවුරුදු 02(දෙකක) වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දීමට තිරණය කරන ලදි.

- පරිපාලන නිලධාරීන්
- ගණකාධිකාරී/ විගණකාධිකාරි
- නීති හා ප්‍රලේඛන නිලධාරීන්
- පුස්තකාල සේවා නිලධාරීන්
- ඉංජිනේරු සේවා නිලධාරීන්

සහ

- අධ්‍යයන සහායක නිලධාරීන්
- වෛද්‍ය හා දන්ත වෛද්‍ය නිලධාරීන්

තවද, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 905 හි සඳහන් පරිදි, වෙනත් මාණ්ඩලික නිලධාරී කාණ්ඩයන්ට අයත් වන සේවකයන් හටද පශ්චාත් උපාධි/ වෘත්තීය සුදුසුකම්, ඔවුන්ගේ උසස් වීම් සඳහා සුදුසුකමක් වන අවස්ථාවලදී මෙම වසර දෙකක අධ්‍යයන නිවාඩුව ලබා දිය හැක.

තවද, මූල්‍ය හා විගණන කාණ්ඩ වලට අයත් නිලධාරීන් හට වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය හෝ ඒ සමාන පිළිගත් වෘත්තීය ආයතනයක අවසාන විභාගය/ සමාජිකත්වය ලබා ගැනීම දක්වා වූ අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව සඳහාද අදාල පරිදි ඔවුන් අන්තර් මාධ්‍ය/ අවසන් විභාග මට්ටමට සුදුසුකම් ලැබූ පසුව මෙම වසර දෙකක අධ්‍යයන නිවාඩුව ලබා ගත හැක. එසේ වුවද, කිසියම් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය සඳහා රැකියා පළපුරුද්ද ලබා ගැනීමට හෝ විභාග සඳහා සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම අධ්‍යයන නිවාඩු ලබා නොදිය යුතුය.

ඉහත සඳහන් සේවක කාණ්ඩ වලට අධ්‍යයන නිවාඩු ලබා දීම පහත කොන්දේසි වලට යටත්ව සිදු කළ යුතුය.

i. අදාල බඳවා ගැනීමේ පටිපාටිය අනුව සේවකයාගේ සේවය තහවුරු කරන අවස්ථාවේදී පශ්චාත් උපාධි/ වෘත්තිය සුදුසුකම් අවශ්‍යතාවයක් වී නම් පමණක් පරිවාස කාලය තුල මෙම අධ්‍යයන නිවාඩු ලබාදිය යුතු ය.

ii. එවැනි පශ්චාත් උපාධි/ වෘත්තිය සුදුසුකම් සේවය තහවුරු කිරීමට අවශ්‍ය නොවන අවස්ථාවලදී එම නිලධාරින් සේවයේ තහවුරු වූ පසු මෙම අධ්‍යයන නිවාඩු ලබාදිය යුතු ය.

iii. අදාල පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය සමඟ අදාල නිලධාරියා ගිවිසුමකට ඇතුළත් විය යුතු වේ.

iv. අධ්‍යයන නිවාඩු ලබා ගත් නිලධාරියා අදාල පශ්චාත් උපාධි/ වෘත්තිය සුදුසුකම් ලබාගැනිම සඳහා ලබාගත් අධ්‍යයන නිවාඩු වලින් පසුව ඔහු/ඇය විශ්‍රාම යැමට වසර 10 (දහය) කට ප්‍රථම එනම් නිලධාරියාගේ 50 (පනස්) වැනි උපන් දිනයට ප්‍රථම සේවයට වාර්තා කළ යුතුයි.

v. ආයතනයේ හෝ පුද්ගලයාගේ අවශ්‍යතාවයට සරිලන පරිදි අදාල අංශ ප්‍රධානියාගේ අභිමතය ඇතිව අධ්‍යයන නිවාඩු ලබාදීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු ය.

vi. සප්ත වාර්ෂික නිවාඩු හිමිකම සමඟ එකට අධ්‍යයන නිවාඩු ලබා නොදිය යුතු ය.

vii. අධ්‍යයන නිවාඩු ලබා ගන්නා නිලධාරින් තමන් සේවය කරනු ලබන විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනයන්හිම පශ්චාත් උපාධි පාඨමාලා හැදැරීම නොකළ යුතු ය.

2010.02.05 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920 හි විධිවිධාන හා අනෙකුත් අදාල සංශෝධන මෙම චක්‍රලේඛය යටතේ අධ්‍යයන නිවාඩු ලබා දෙන නිලධාරින්ට බලපවත්වනු ඇත.

ඒ අනුව 1990.05.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 440 හි 3(iii) ඡේදය හා පහත සඳහන් චක්‍රලේඛ, එකී චක්‍රලේඛ විධිවිධාන අනුව මේ වන විට ලබාදුන් අධ්‍යයන නිවාඩු වලට බාධාවක් නොවන සේ අවලංගු වේ.

1990.05.02 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 440 හි 3(iii) ඡේදය
1994.03.21 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 601
2002.11.08 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 809
2010.09.27 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 931
2010.10.25 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 936

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්‍ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/4/16